WWW.OLEVELAPI.COM

සියලු ම හිමිකම් ඇවිරිණි / முழுப் பதிப்புரிமையுடையது /All Rights Reserved]

ශ්‍රී ලංකා විභාග දෙපාර්තමේන්තුව ශ්‍රී ලංකා විභාග දෙපාර්තමේන්තුව ශ්‍රී ලංකා විභාග දෙපාර්තමේන්තුව ශ්‍රී ලංකා විභාග දෙපාර්තමේන්තුව
இலங்கைப் பரீட்சைத் திணைக்களம்
Department of Examinations, Sri Lanka

89 | S | I, II


අධ්‍යයන පොදු සහතික පත්‍ර (සාමාන්‍ය පෙළ) විභාගය, 2024(2025)
கல்விப் பொதுத் தராதரப் பத்திர (சாதாரண தர)ப் பரீட்சை, 2024(2025)
General Certificate of Education (Ord. Level) Examination, 2024(2025)

නිර්මාණකරණය හා යාන්ත්‍රික තාක්ෂණවේදය	**I, II**
வடிவமைப்பும் இயந்திரத் தொழிட்பவியலும்	**I, II**
Design and Mechanical Technology	**I, II**

නිර්මාණකරණය හා යාන්ත්‍රික තාක්ෂණවේදය II

* **පළමුවන** ප්‍රශ්නය හා තෝරාගත් තවත් ප්‍රශ්න **හතරක්** ඇතුළුව ප්‍රශ්න **පහකට** පිළිතුරු සපයන්න.
* පළමුවන ප්‍රශ්නයට ලකුණු **20** ක් ද, තෝරා ගන්නා එක් ප්‍රශ්නයකට ලකුණු **10** බැගින් ද හිමි වේ.

1. (i) වස්තුවක සමාංශ ප්‍රක්ෂේපණ පෙනුමක් පහත දැක්වේ.



ඉහත සමාංශ රූපයට අනුව

(1) ***A*** ඊතලය දෙසින් බලා ඉදිරි පෙනුම ද

(2) ***B*** ඊතලය දෙසින් බලා පැති පෙනුම ද

(3) ***C*** ඊතලය දෙසින් බලා සැලැස්ම ද


ඍජු ප්‍රක්ෂේපණ චිත්‍ර ඇඳීමේ තෙවන කෝණ ක්‍රමයට දී ඇති මිනුම්වලට අනුව සම්පූර්ණ පරිමාණයට අඳින්න. (මිනුම් දී ඇත්තේ මිලිමීටරවලිනි)


(ii) මහා අක්ෂය 80 mm හා සුළු අක්ෂය 50 mm වූ ඉලිප්සයක් සම්මත ඕනෑම ක්‍රමයකට අනුව අඳින්න. නිර්මාණ රේඛා පැහැදිලිව තිබිය යුතු ය. ඔබ ඉලිප්සය නිර්මාණයට භාවිත කළ ක්‍රමය නම් කරන්න.

[හත්වැනි පිටුව බලන්න.

අපොස සාමාන්‍ය පෙළ සියලුම විෂය ධාරාවන්ට අදාල ප්‍රශ්න පත්‍ර/පිළිතුරු පත්‍ර/සටහන් හා තවත් බොහෝ දෑ ලබාගැනීමට පිවිසෙන්න www.olevelapi.com වෙත ...

2. පාසල් සුබසාධක සංගමය මගින් ක්‍රියාත්මක කරන ආපන ශාලාව සඳහා ඉක්මනින් රොටී සෑදීමට හැකි උපකරණයක් නිර්මාණය කිරීමට තාක්ෂණ ඒකකයට භාර විය. නිර්මාණය කරන ලද එම උපකරණයේ සැලසුම පහත රූපසටහනින් දැක්වේ. පාසලේ තාක්ෂණ ඒකකයෙන් සපයාගත හැකි ආවුද, උපකරණ, දැව කොටස්, තහඩු කොටස්, ආදිය පහත දක්වා ඇත.





* 25 mm ඝනකම ලෑලි
* දිග 50 mm, පිත්තල පෙට්ටි සරනේරු යුගලක් හා එයට ගැළපෙන ඉස්කුරුප්පු ඇණ
* 1 mm ඝනකම ඇලුමිනියම් තහඩුවක්
* කැපීමේ, විදීමේ හා සවි කිරීමේ ආවුද හා උපකරණ
* නිමහම් කිරීමේ ද්‍රව්‍ය
* මිනුම් ගැනීමේ හා සලකුණු කිරීමේ උපකරණ

WWW.OLEVELAPI.COM

(i) මෙහි සරනේරු වෙනුවට භාවිත කළ හැකි අවට පරිසරයෙන් සපයා ගත හැකි විකල්ප ද්‍රව්‍ය **දෙකක්** නම් කරන්න.

(ii) මෙම රොටී සාදන උපකරණය නිර්මාණය කිරීමේදී අනුගමනය කළ යුතු ක්‍රියාවලිය, ඒ ඒ කාර්යයන්ට භාවිත කරන ආවුද හා උපකරණ සඳහන් කරමින් පියවර වශයෙන් විස්තර කරන්න.

(iii) මෙම උපකරණය භාවිත කර රොටී සෑදීමේදී රොටී පිටි මිශ්‍රණය ලෑලි මත ඇලීම වළකා ගැනීමට යොදන ඇලුමිනියම් තහඩු, ලෑලි මත සවි කිරීමට යොදාගත හැකි ක්‍රම **දෙකක්** රූපසටහන් සහිතව විස්තර කරන්න.

3. මිටියම් කිරීම යනු තහඩු කොටස් දෙකක් හෝ කිහිපයක් මිටියම් ඇණ යොදා සම්බන්ධ කිරීමේ ක්‍රියාවලියයි.

(i) මිටියම් කිරීම මගින් කොටස් සම්බන්ධ කරන අවස්ථා **හතරක්** සඳහන් කරන්න.

(ii) මිටියම් කිරීමේ ක්‍රියාවලිය සඳහා භාවිත කරන ආවුද හා උපකරණ ලැයිස්තුවක් සකස් කරන්න.

(iii) තහඩු කොටස් මිටියම් කිරීමේ ක්‍රියාවලිය රූපසටහන් සහිතව කෙටියෙන් විස්තර කරන්න.

[අටවැනි පිටුව බලන්න.

අ.පො.ස සාමාන්‍ය පෙළ සියලුම විෂය ධාරාවන්ට අදාල ප්‍රශ්න පත්‍ර/පිළිතුරු පත්‍ර/සටහන් හා තවත් බොහෝ දෑ ලබාගැනීමට පිවිසෙන්න www.olevelapi.com වෙත ...

4. විද්‍යුත් චාප පෑස්සීම ඉතා ප්‍රචලිත පෑස්සුම් ක්‍රමයකි.

(i) විද්‍යුත් චාප පෑස්සුම් ක්‍රමය සඳහා යොදාගන්නා උපකරණ, ද්‍රව්‍ය සහ මෙවලම් නම් කරන්න.

(ii) හොඳ විද්‍යුත් චාප පෑස්සුමක් සඳහා බලපාන කරුණු **තුනක්** ලියා දක්වන්න.

(iii) පෑස්සුම් කුර වටා ආලේප කර ඇති සෘන්ද මගින් ඉටුවන කාර්ය **තුනක්** විස්තර කරන්න.

5. යතුරුපැදියක විවිධ උපාංග ක්‍රියාත්මක කිරීම සඳහා විදුලි පද්ධතියක් යොදාගෙන ඇත.

(i) යතුරුපැදියක විදුලි පද්ධතිය ආශ්‍රිතව ඇති විය හැකි දෝෂ **තුනක්** සඳහන් කරන්න.

(ii) ඉහත (i) සඳහන් දෝෂ නිවැරදි කරන ආකාරය විස්තර කරන්න.

(iii) යතුරුපැදියක හිරිංග පහන් පද්ධතියේ දළ පරිපථ සටහනක් ඇඳ කොටස් නම් කරන්න.

6. වාත්තු කිරීමෙන් නිපදවෙන භාණ්ඩ ජන ජීවිතයේ විවිධ අවශ්‍යතා සඳහා යොදාගනී.

(i) වාත්තු කිරීම මගින් භාණ්ඩ නිපදවීමේදී ලැබෙන වාසි **හතරක්** ලියා දක්වන්න.

(ii) වාත්තු කිරීමෙන් නිපදවූ භාණ්ඩවල දැකිය හැකි දුබලතා **තුනක්** ලියා දක්වන්න.

(iii) ඉටිවලින් සාදාගත් වාත්තු මලක් 'අරුව' තුළින් ඉවත් කරගැනීමේ ක්‍රියාවලිය රූපසටහන් සහිතව විස්තර කරන්න.

7. යන්ත්‍ර ක්‍රියාත්මක කිරීමේදී ඒවායේ විවිධ කොටස් විවිධ ආකාර චලිතයන්ගෙන් යුක්ත වේ.

(i) මූලික චලිත ආකාර **හතර** ලියා දක්වන්න.

(ii) චලිත පරිවර්තන යාන්ත්‍රණය රූපසටහනක් ඇසුරෙන් දක්වන්න.

(iii) චලිත පරිවර්තන සඳහා ආකෘති තැනීමේදී ඇතිවන ෆැටලු විසඳීමේ ක්‍රමවේදයේ, අන්තර්ගත මූලිකාංග විස්තර කරන්න.

* * *

WWW.OLEVELAPI.COM

අ.පො.ස සාමාන්‍ය පෙළ සියලුම විෂය ධාරාවන්ට අදාල ප්‍රශ්න පත්‍ර/පිළිතුරු පත්‍ර/සටහන් හා තවත් බොහෝ දෑ ලබාගැනීමට පිවිසෙන්න www.olevelapi.com වෙත ...